# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,817 — 1930ක්වූ දෙසැම්බර් මස 5 වෙනි දිනවූ සිකුරාද.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන මහනුවර නාගරිකය තුළ පිහිටා තිබෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 19වෙනි දින පූර්වභාග 10.30ගේ කනිසමට මහනුවර කච්චේරියේදී බද්දට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත.

එනම් : මධ්‍යම දිසාවේ මහනුවර නාගරිකය තුළ පිහිටි බිම්කැබෙල්ලක්ය.

මූල් සිතියමේ නො. 6,753.

| බිම්කට්ටියේ නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | විස්තර. | ප්‍රමාණය. |
|---|---|---|---|---|
| 3 (කොටසක්) | උඩවත්තේකැලේ නොහොත් මහසියාවේ රැනැබෑරුම තිබුන බිම්කැබෙල්ල | (1) ඇම්. චාර්ල්ස් ප්‍රනාන්දු, (2) ඒ. ඇම්. පුංචිබන්ඩා, (3) ඩබ්ලිව්. ඩී. ලාසරස්, (4) කේ. ඒ. දවිත් අප්පුහාමි, (5) ඇන්. බී. ගිරිගෝරිස් අප්පුහාමි, (6) ඩබ්ලිව්. ජුවානිස් ප්‍රනාන්දු | මහසියාවේ රැනැබෑරුම තිබුන බිම්කැබෙල්ල | දිග අඩි 37ක් හා පළල අඩි 20ක ප්‍රමාණය |

බද්දේ කොන්දේසි.

(1) බද්ද අවුරුද්දට රුපියල් 60ක ලන්සයේ සිට වෙන්දේසියේ විකුණනු ලැබේ.
(2) බද්ද පටන්ගන්ට යෙදෙන්නේ වර්ෂ 1931ක්වූ ජනවාරි මස 1වෙනි දින සිටය.
(3) අවුරුදුපතා ගෙවියයුතු බදුමුදල අවුරුද්දේ මුලදී ගෙවිය යුතුය.
(4) බද්ද G. A. C. 144 නමැති ෆෝර්මයේ අවුරුදු 5කට දෙනුලැබේ. අවශ්‍යවීනම් මෙම බද්ද බදුකාරයා විසින් බදු ඉඩම තුළ කරතිබෙන වැඩිදියුණුවලට අලාභයක් නොගෙවා මාසයක් කල්දී අවලංගුකරණු ලැබේ.
යම් කරුණක් නිසා බද්දේ සම්පූර්ණ කාලය ඉකුත්වෙන්ට මත්තෙන් බද්ද අවලංගුකරන්ට යෙදුනොත් බද්දට ගෙවා තිබෙන බදු මුදලෙන් ඒ කාලයට වැටගෙන මුදලක් අපසු ගෙවනු ලැබේ.
(5) ඉඩම තුළ තිබෙන ගස් නොකැපිය යුතුයි.
(6) ඉඩමෙහි ස්ථිර ගොඩනැගිලි නොකළ යුතුය—තාවකාලික වශයෙන් ගොඩනැගිල්ලක් සෑදිය හැක. එම ගොඩනැගිල්ලේ සැලැස්මක් මහනුවර නාගරික සභාවටද, තව එකක් ඒජන්ත උන්නාන්සේටද අනුමතකිරීම පිණිස ප්‍රථමයෙන් යැවිය යුතුය—බද්ද අවසානවූ පසු ගොඩනැගිල්ලට අලාභයක් ඉල්ලුම්කළ නොහැකිය.

වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන් දැනගත හැක.

වර්ෂ 1930ක්වූ නොවැම්බර් මස 27වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන්,
මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

---

### දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් බදු විකිණීම.

වර්ෂ 1930ක්වූ ජූනි මස 13වෙනි දින දරණ නොම්මර 7,785 ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරණලද එම මස 9වෙනි දින හා නොම්මර 12 දරණ මාතර දිසාවේ ඉඩම් දියුණුකිරීමේ දැන්වීමට ඇතුළත්වූ මොරවක්කෝරළේ උඩුරැබොක්ක යන ගමේ පිහිටා තිබෙන පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම් කැබලිවල 99 අවුරුද්දේ බද්ද වර්ෂ 1931ක්වූ පෙබරවාරි මස 2වෙනි සඳුදින පෙරවරු 10ට මාතර උප දිසාපතිතුමා විසින් මාතර කච්චේරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බදු කොන්දේසි මාතර කච්චේරියෙන් ඉල්ලා බලාගත හැක.

1125——J. N. 1417-139 (12/30)

S 1

**මාතර දිස්ත්‍රික්කයේ මොරවක්කෝරළේ උරුබොක්ක යන ගමේ අවසාන සිතියම නො. 23.**

**ඉල්ලුම්කාරයෝ—ග්‍රේගරී සහ ග්‍රිෆිත්ස් යන මහත්වරු.**

| කැබැල්ල. | ඉඩමේ නම. | ස්වභාව. | බිම්ප්‍රමාණය. අ. රූ. ප. | අක්කරයකට ගෙවිය යුතු ඉතා අඩු මිල. රු. ශ. | මුල 30 අවුරුද්ද තුළ වර්ෂයකට ගෙවියයුතු අක්කරයක බදු මුදල — මුල හය අවුරුද්දේ එක එක වර්ෂයකට. රු. ශ. | මුල 30 අවුරුද්ද තුළ වර්ෂයකට ගෙවියයුතු අක්කරයක බදු මුදල — ඉතිරි 24 අවුරුද්දේ එක එක වර්ෂයකට. රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 45 | මියන්ගමලහේන, මීගහවිලහේන .. | කැලෑව .. | 3 3 34 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45H | මියන්ගමලහේන .. .. | එම .. | 0 0 28 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45I½ | මියන්ගමලහේන, ලෙවන්කැලේ .. | එම .. | 1 0 14 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45J | එම .. .. | එම .. | 6 0 16 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45K | එම .. .. | එම .. | 4 3 29 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45L | එම .. .. | එම .. | 10 2 4 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45P | එම .. .. | එම .. | 9 1 35 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45Q | මියන්ගමලහේන .. .. | එම .. | 4 3 26 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45S | එම .. .. | එම .. | 3 2 26 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45Y | මීගහවිලහේන, ලෙවන්කැලේ .. | එම .. | 7 3 23 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45Z | මියන්ගමලහේන, මහහේන, ලෙවන්කැලේ | එම .. | 9 0 38 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45AC | මියන්ගමලහේන, කරන්වලදෙනියමූකලාන | එම .. | 5 1 32 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| 45AD | මියන්ගමලහේන, මීගහවිලහේන | එම .. | 6 2 25 .. | 7 10 .. | 1 20 .. | 3 60 |
| | | | 74 0 10 | | | |

වම් 1930ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින කොළඹ මහ ලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. එච්. බෝර්ඩිලන්,
මහ ලේකම් වම්හ.

---

වම් 1929ක්වූ ඔක්තෝබර් මස 11වන දින නිකුත් අංක 7,738 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ වම් 1929ක්වූ සැප්තැම්බර් මස 25වන දින හා අංක 3 දරන බදුලු දිස්ත්‍රික්කයේ ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීමෙහි ඇතුළත්වූ කටුගහ යන ගමෙහිද වම් 1930ක්වූ මාර්තු මස 7වන දින නිකුත් අංක 7,765 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ වම් 1930ක්වූ මාර්තු මස 1වන දින හා අංක 20 දරන බදුලු දිස්ත්‍රික්කයේ ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීමෙහි ඇතුළත්වූ ආලුවෙල යන ගමෙහිද පිහිටි මෙහි පහත සඳහන්වෙන රජසන්තක ඉඩම් කොටස්වල බද්ද ඌව දිසාවේ ආණ්ඩුවේ දිසාපති උන්නාන්සේ විසින් වම් 1931ක්වූ ජනවාරි මස 19වෙනි දින පස්වරු 1.45ට බදුලු කච්චේරියේදී විකිණීමට දමනු ලැබේ.

ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීමක් යටතේ සීමාකරනලද වෙන්දේසියෙන් විශේෂ විකිණීම් වගන්ති අනුව මෙම විකිණීම කරනු ලැබේ. එම විශේෂ වගන්තිවල පිටපතක් බදුලු කච්චේරියෙන් ඉල්ලා බලාගතහැක.

අන්තිම ගම් සිතියමේ නො. 32. ගම—උඩුකිඳපලාත දෙහිවිනිපලාතකෝරළේ, කටුගහ.

| බිම් කැබෙල්ල. | ඉඩමේ නම. | විස්තර. | ඉල්ලුම්කාරයා. | ප්‍රමාණය. අ. රූ. ප. | වෙන්දේසිය පටන්ගන්න අක්කරයක ප්‍රමිතම් ගනාණ. රු. ශ. | පළමු තිස් අවුරුද්දට අක්කරයකට අවුරුද්දක බද්ද — එක එක පළමු හය අවුරුද්දට. රු. ශ. | පළමු තිස් අවුරුද්දට අක්කරයකට අවුරුද්දක බද්ද — එක එක ඉතිරි විසිහතර අවුරුද්දට. රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| 20N | උඩ්ගොඩපතන .. | පතන .. | — | .. 16 3 0 | .. 9 0 | .. 3 0 | .. 9 0 |
| | අන්තිම ගම් සිතියමේ නො. 22. ගම—යටිකිඳපලාත බෝගොඩකෝරළේ, ආලුවෙල. | | | | | | |
| 2B | හුරියගෙලවැටගාවා ගල්පිල හුරියගෙල පයාත | පතන .. | — | .. 25 2 31 | .. 6 0 | .. 2 0 | 6 0 |

වම් 1930ක්වූ නොවැම්බර් මස 28වෙනි දින කොළඹ මහ ලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. එච්. බෝර්ඩිලන්,
මහ ලේකම් වම්හ.

---

**No. 9,751, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1931ක්වූ පෙබරවාරි මස 7වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 8.30ට කනෝගම හැසිබංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කර දෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දේවමැදිහත්පත්තුවේ අන්ගොමුකෝරළේ කොටසයේ පිහිටා තිබෙන බිම් කැබෙලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,422. ගම—දන්ගොල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | මීගහමූලවත්ත .. | (1) වහලමුනිආරච්චිලාගේ පුංචප්පු, (2) එම ලූසිහාමි, (3) එම හෙන්ද්‍රික්සිංඤෝ, (4) එම සියප්පුවා | වත්ත | .. 7 0 32 |
| 6 | කදුරුගහමූලවත්ත | එම .. .. .. | එම | .. 3 1 0 |
| 7 | මසිලගහමූලහේන .. | එම .. .. .. | හේන | .. 2 2 21 |

අක්කරයක තක්සේරුමිල රුපියල් 100 දක්වාය.

මෙම ඉඩම්ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ජ්වාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1930ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින කොළඹ මහ ලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. එච්. බෝර්ඩිලන්,
මහ ලේකම් වම්හ.

---

**No. 9,752, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1931ක්වූ ජනවාරි මස 24වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 9.30ට මොරගල තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. බස්නාහිර දිසාවේ කළුතර පලාතේ නැගෙනහිර පස්දුන්කෝරළේ දකුණු මහපත්තු කොටසයේ පිහිටා තිබෙන බිම්කැබෙලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 109. ගම—මීනගහතැන්න.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 38D | කිරිබත්ගසහේන .. | ආණ්ඩුව, පල්ලේකන්කානම්ගේ ජුවානිස් අප්පුගේ වගාව .. | වත්ත | .. 0 0 23 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 200 දක්වාය.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වම් 1930ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින කොළඹ මහ ලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. එච්. බෝර්ඩිලන්,
මහ ලේකම් වම්හ.

**No. 9,753, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1931ක්වූ ජනවාරි මස 19වෙනි දිනවූ සඳුදා පෙරවරු 10ට කොළඹ ඉඩම් බේරුම්කරණ කන්තෝරුවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යොදනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ මාගම්පත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ටෝපෝ මුල් සිතියමේ නො. 2 (කොටස 1). ගම—කිරින්ද.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප |
|---|---|---|---|---|
| 6E | කිරින්දගොඩත .. | ආණ්ඩුව, කොළඹ ප්‍රදීපාගාරය, අයිතිකාරයින් විසින් බදු අර ගන තිබේ | මුඩුබිම | .. 0 0 29 |

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින කොළඹ
මහ ලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. එච්. බෝර්ඩිලන්,
මහ ලේකම් වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ශ්‍රේෂ්ඨාධිකරණ මන්ත්‍රණසභාවේ සම්මතය ඇතුව වර්ෂ 1911යේ 10වෙනි ආඥාපනතේ 3වෙනි වගන්තියෙන් ප්‍රකෘතිමත් වර්ෂ 1876යේ 3වෙනි ආඥාපනතේ 6වෙනි වගන්තියේ ප්‍රකාර ක්‍රියාකරණ ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් මෙහි පහත පෙනෙන ඉඩම ප්‍රසිද්ධ කටයුත්තක් සඳහා, එනම්:—හැව්ලොක් පාරේ වංගුව ඇදඇරීමට උවමනා බැවින් අයිතිකරගැනීමට අනකරණලදී.

ප්‍රාරම්භ පැලැන නො. 20,035. ගම—දකුණු කිරිල්ලපනේ.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියාසිටින අයගේ නම. | විසාලකම්, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හැව්ලොක් පාරේ වරිපනම් නො. 591 දරණ ඉඩම | අවුරුදු 60ක් වයසැති පොල්ගස් 7ක්ද, අවුරුදු 8ක් වයසැති පුවක්ගස් 7ක්ද, අවුරුදු 6ක් වයසැති කොස්ගසක්ද, හුණෙන්බැඳි කාප්ප කොටසක්ද ඇති පොල්වත්ත | බී. ජේ. විජේරත්න | .. 0 0 7·5 |

එකී ආඥාපනතේ 7වෙනි වගන්තියේ ප්‍රකාර යුතු අන්දමින් අයිතිකරගැනීමට අදහස්කරණ බැව් ප්‍රසිද්ධයේ මෙයින් දැනුම්දෙමි.

ඒ නිසා එකී ඉඩම ගැන අයිතිකම් කියා සිටින අය හෝ බවුන් වෙනුවෙන් පෙනීසිටින අය හෝ තමන්ගේ අයිතිවාසිකමේ අන්දමද, ඒ වෙනුවට ඉල්ලාසිටින වටිනාකමද, ඒවා අයිති ඔප්පුද, රිජිස්ටර් පොතේ කොපියක්ද, එගෙණ ඉඩම ගැන වටිනාකම ලැබීමට තිබෙන යුතුකම්ද පෙන්වා සිටින පිණිස වර්ෂ 1931ක්වූ ජනවාරි මස 14වෙනි දින පෙරවරු 10යට කොළඹ නාගරික සභාකන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණෙන්ට ඕනෑය.

වර්ෂ 1930ක්වූ නොවැම්බර් මස 28වෙනි දින
කොළඹ නාගරිකසභා කන්තෝරුවේදීය.

එච්. ඊ. නියුන්හැම්,
කොළඹ නාගරික සභාවේ සභාපතිතැන සහ නගරාධිපතිතුමා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒ නම්:—ජලගැල්ම වැලැක්වීම පිණිස කැලණිගඟේ උතුරු ගංඉවුරේ ආධාර බැම්මක් නැඟීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" යනුවෙනි නාමයෙන් කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 20,106. ගම—පැළියගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අඹගහවත්ත .. | පොල්ගස් 25ද, කොස්ගස් එකක්ද, පුවක්ගස් 13ද, ගලෙන බැඳ උළු සෙයනලද ගෙයක්ද, ගලෙන් බැඳ උළු සෙයනලද වැසිකිළියක්ද, ගලෙන් බැඳපු පඩිවලින යුත් ළිඳක් සහ බැම්මකින් කොටසක්ද ඇති පොල් ඉඩම | ජෝර්ජියානා පෙරේරා නෝනාමහත්මිය | 0 1 39·4 |
| 2 | එම .. | පොල්ගස් 7ද, අඹගහක් සහ බැම්මකින් කොටසක්ද ඇති පොල් ඉඩම | ඇස්. ඩී. වජ්‍රසේක | .. 0 1 13·8 |
| 3 | එම .. | පොල්ගස් 2ද, පුවක්ගස් 15ක් සහ බැම්මකින් කොටසක්ද ඇති පොල් ඉඩම | ජී. තෝමස් සිල්වා, ජී. ඉඩුසියානා සිල්වා සහ යූ. ගේබ්‍රියෙල් අප්පුහාමි | 0 0 14·5 |
| 4 | එම .. | පොල්ගස් 4ද, දෙල්ගහක් සහ බැම්මකින් කොටසක්ද ඇති පොල් ඉඩම | එම | .. 0 0 13 |
| 5 | එම .. | පොල්ගස් 5ක් සහ දෙල්ගහකින් යුත් පොල් ඉඩම | ඇස්. ඩී. වජ්‍රසේන | .. 0 0 15·3 |
| 6 | එම .. | පොල්ගස් 6කින් යුත් පොල් ඉඩම .. | ජෝර්ජියානා පෙරේරා නෝනාමහත්මිය | 0 0 11·8 |
| 7 | බංගලාවත්ත .. | පොල්ගස් 20ද, අඹගහක් සහ බැම්මකින් කොටසක්ද ඇති පොල් ඉඩම | අයි. එමානිස් අප්පුහාමිගේ නෝනා මහත්මිය | 0 1 5·2 |
| 8 | එම .. | පොල්ගස් 24ක් සහ බැම්මකින් කොටසක්ද ඇති පොල් ඉඩම | එම | .. 0 2 18 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජනවාරි මස 5වෙනි දින පෙරවරු 10යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

එච්. පී. කැප්මන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—වැසිකිළියක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 20,081, ගම—සීදුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පඹුරුගහවත්ත, වරිපනම් නො. 179 | පොල්ගසකින් යුත් ඉඩම .. | එච්. විලියම්සිල්වා .. | 0 0 4·2 |
| 2 | පඹුරුගහවත්ත, වරිපනම් නො. 180 | පොල්ගස් 2ක් ඇති ඉඩම .. | ජේ. ජුවන් ප්‍රනාන්දු .. | 0 0 6·1 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජනවාරි මස 12වෙනි දින පෙරවරු 10යේ කාලසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

එච්. පී. කෑෆ්මන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මහනුවර සිට අම්පිටියට යන පාරේ හැතැප්ම් 2යක් කනුව ලඟ පාර පළල්කොරීම සහ ගල්ගබඩාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 8,726. ගම—පාතහේවාහැටේ ගන්දගේ උතුර අම්පිටිය උඩගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | දඹගොල්ලේවත්ත නොහොත් ඉලංගොල්ලේවත්ත | වවා තිබෙන ඉඩම .. | විල්ආරච්චියෑ ගොපියා පෙරේරා, නුවරඑලියේ බී. ඩබ්ලිව්. පෙරේරාගෙ පවුල | 0 0 6·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජනවාරි මස 9වෙනි දින පස්වරු 2යෑ කාලසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1930ක්වූ නොවැම්බර් මස 26වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොඩ්සෝල්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—තෝටන් සහ ඔස්බෝන් පාර සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 8,896. ගම—උඩබුලත්ගම අඹගමුකෝරළේ හාතිෂ් යන ගමෙ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගෙලැන්ගරීජ්වත්ත .. | අවුරුදු 30යේ තේ සහ පාර | නැසීගිය පී. ඒ. බී. සම්පායෝ උන්නාන්සේගේ උරුමකාරයෝ (කාසන් කොම්පැනිය බාරව) | 5 3 9·3 |
| 2 | ඔස්බොන්වත්ත .. | එම .. | අප්ලන්ඩ් තේ වතු සමාගම (විතල් කොම්පැනිය බාරව) | 5 1 22·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජනවාරි මස 9වෙනි දින පස්වරු 2යේ කාලසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1930ක්වූ නොවැම්බර් මස 26වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොඩ්සෝල්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මහවැලේ ප්‍රසිඛ තක්කුන්සියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 7,397. ගම—පහල මහවැව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බෝගහවත්ත .. | පොල්වත්ත, අවුරුදු 30ක්වූ පොල් ගස් 13ක්ද, තාවකාලික ගොඩනැගිලි 2ක්ද තිබේ | මීටර්කොටුවේ වර්ණකුලසූරිය තෙලේනිස් ප්‍රනාන්දු සහ වර්නකුලසූරිය මනුවෙල් ප්‍රනාන්දු | 0 0 29·50 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජනවාරි මස 7වෙනි දින උදේ 10.30යේ කාලසමට මාදම්පේ ගම්සභාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

ඩබ්ලිව්. ජේ. ඇල්. රොජර්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හල්මුරුවේ බෙහෙත් සාලාවක් හා තැපැල් කන්තෝරුවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. 7,408. ගම—කුඹීරිප්පුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ලිමවත්ත හොහොත් හික්ගහවත්ත | අවුරුදු 30ක්වූ පොල්ගස් 3ක් ඇති වත්ත | හේරත්මුදියන්සෙලාගේ ගුරුනාම් හේරත් ගුණරත්න විදාන මුහන්දිරම් | 0 0 2·10 |
| 2 | එම .. | අවුරුදු 30ක්වූ පොල්ගස් 5ක් හා කොස්ගස් 1ක් ඇති වත්ත, එහි ගෙයක්ද තිබේ | එම . .. .. | 0 0 11·12 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජනවාරි මස 7වෙනි දින උදේ 10යේ කනිසමට මාදම්පේ ගම්සභාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

ඩබ්ලිව්. ජේ. ඇල්. රෙජර්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පොල්වැවීම හා ඒ සම්බන්ධ කටයුතු පරීක්ෂාකර දියුණුකිරීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 7,409. ගම—බන්ඩිරිප්පුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | බන්ඩිරිප්පුවවත්ත .. | පොල්වත්ත අවුරුදු 15වත් 35වත් අතරවූ පොල් ගස් 10,139ක්ද, ගොඩනැඟිලි 5ක්ද, තාවකාලික පොඩි ගෙවල් 3ක්ද තිබේ | ජේ. කොස්මස්, තැපැල් පෙට්ටිය නොම්මර 306, කොළඹ | 149 3 37 |
| 4 | එම .. | පොල්වත්තක කොටසක් අවුරුදු 30ක්වූ පොල් ගස් 5ක් තිබේ | එම .. | 0 0 10 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජනවාරි මස 7වෙනි දින 2යේ කනිසමට මාරවිල නාගයමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

ඩබ්ලිව්. ජේ. ඇල්. රෙජර්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—නියදගල ළිඳක් කැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

නො. 40ඒ ටෝපෝ සිතියමේ නො. 1යේ අතිරේකය. ගම— නියදගල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 3A | ගලගාවාකුඹුර .. | කුඹුර .. | වැල්ලවාගේ ඒ. බී. ඇස්. විජේසිංහ සහ ඇෆ්. සී. ඇස්. විජේසිංහ සහ තනමල්විල එච්. ලීලාවතී විජේසිංහ | 0 0 6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජනවාරි මස 16වෙනි දින පස්වරු 2යේ කනිසමට බදුළු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින
බදුළු කච්චේරියේදීය.

ඒ. ඊ. මිලිංටන්,
ඌව පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—තෝලන්ගොමුවේ මිශ්‍ර පාඨශාලාවට පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 3,843. ගම—තෝලන්ගොමුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ලසිංමහේන .. | හේන, දැනට සෙක්ල ගොඩ නැඟිලි තිබේ | ඇස්. ඩින්සිරි අප්පුහාමි සහ තවත් අය .. | 3 0 26·4 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජනවාරි මස 21වෙනි දින පෙරවරු 10යේ කනිසමට කෑගල්ලේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1930ක්වූ නොවැම්බර් මස 29වෙනි
දින කෑගල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[මන්නාරම දැන්වීම නො. 10,800.]

**වර්ෂ 1897දෙ, 1899යේ සහ 1900යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.**

මෙහි පහත සඳහන්වෙන ඉඩම සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මන්නාරම් දිස්ත්‍රික්කෙ කච්චේරියට ඇවිත් දෙවනි ඒජන්ත උන්නාන්සෙ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩමට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කියා නොසිටියොත් එකී දෙවනි ඒජන්ත උන්නාන්සෙ විසින් වර්ෂ 1897දෙ 1වෙනි ආඥාපණතෙන් උන්නාන්සෙට ලැබී තිබෙන බලපූර්වන්කම් වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම රජසන්තක ඉඩමක් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙසින් දැනගත යුතුයි.

ආර්. ඇම්. ඩේවිස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්ගය.

කියන්නෙ මේ ඉඩම ගැණයි.

(*a*) මෙම උවමනා කාරනා ඉඩම සම්බන්දව මන්නාරමේ උප ඒජන්ත උන්නාන්සේගෙන් දැනගත හැකිය. ඉඩමේ ප්ලෑන සර්වේයර් ජනරාල් තුමාගෙන් ලබාගත හැකිය.

(*b*) ඉඩම උඩින් යන පාරකට අයිතිවාසිකම තිබේනම්, එය ඉඩමට අයිතිවාසිකමක් හැටියට බාරගනු ලැබේ.

ඉඩමේ විස්තර.

මෙය කැබෙල්ල පිහිටා තිබෙන්නෙ, මන්නාරම දිස්ත්‍රික්කයේ දකුණු මුදලි කොට්ඨාසයේ මුල්ලිස්කුලම් යන ගමේය.

සිතියමේ නො. 6,918.

| ලොට් නො. | ඉඩමේ නම. | අ. රූ. ප. |
| --- | --- | --- |
| 1 | පුකුලම්තෝවම් .. | .. 1 1 7 |

මායිම්—උතුරට : ආණ්ඩුවේ ඉඩම.
නැගෙණහිරට : පොකුන.
දකුණට : 6,918වේ පැලෑනේ ලොට් නො. 2.
බස්නාහිරට : මූද.

---

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

කොළඹ කුරුඳුවත්තෙ තිබෙන මෙහි පහත පෙනෙන ලැයිස්තුවේ සම්පූර්ණයෙන් සඳහන්කර තිබෙන ඉඩම්කට්ටියට 28 බදු ඔප්පුවට අඩංගුවන පොරොන්දුවලට යටත්ව (මෙම පොරොන්දු කොළඹ කච්චේරියෙන් දැනගත හැකිවේ) වර්ෂ 1931ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුදු 1ක බද්ද විකිණීමට මුද්‍රා තබාපූ ඉල්ලුම්පත්‍ර නොහොත් ටැන්ඩර් පත්‍ර බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සෙ විසින් බාරගන්නා බව මෙසින් දන්වමි.

2. ඉඩම් කට්ටියට එවන ටැන්ඩර්පත්‍ර "කොළඹ කුරුඳුවත්තෙ බදු ඉල්ලීමේ ටැන්ඩර්පත්‍රයයි" කියා ලියුම් කවරයේ පිට ලියාදමන්ට ඕනෑය. මේ පත්‍ර කොළඹ කච්චේරියේදී වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 22වෙනි සඳුදා දවල් 1 වනතුරු බාරගෙන කඩාබලනවා ඇත. ටැන්ඩර්පත්‍රය සැබෑ බව ඔප්පුවීමට ටැන්ඩර් ඉල්ලුම්කරන්නාවූ සියල්ලම ඒජන්ත උන්නාන්සෙ ඉදිරියේ තමන්ම පෙණීසිටින්ට ඕනෑය. එසේ කරන්ට නොයෙදුනොත් ඔවුන්ගේ ටැන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ. ඒජන්ත උන්නාන්සෙ වැඩිම නොහොත් කොයියම් ඉල්ළුම්පත්‍රයක්වත් බාරගන්ට බැඳි නැත.

3. ලංකාණ්ඩුකාර උතුමානන්වහන්සෙ විසින් ස්ථිරකිරීමට ඒජන්ත උන්නාන්සෙ විසින් තෝරාගන්ට යෙදෙන ටැන්ඩර් පත්‍රයේ ඉල්ළුම්කාරයා විසින් අවුරුද්දක බදු මුදලෙන් දහයෙන් කොටසක් මුදලෙන් කච්චේරියේ තැන්පත්කරන්ට ඕනෑ බවත් උතුමාණන්වහන්සෙ විසින් ටැන්ඩර්පත්‍රය ස්ථිර කරන්ට යෙදුනොත් ඔහුගේ ඉල්ලීම පිළිගත්බවට දැන්වීම ලැබී 14 දවසක් ඇතුළතදී මුළු බදු මුදලෙන් දෙකෙන් පංගුවකට ඉඩම්වලින් ඇප තිබන්ට හෝ මුළු බදු මුදලෙන් හතරෙන් කොටසක් කාසිවලින් හෝ ඇප බදින්ට ඕනෑය.

4. ඇප තබන්ට යෙදෙන ඉඩම්වල මුල් ඔප්පු විභාග කිරීමට යෙවියයුතු ආණ්ඩුවේ අද්වකාත් උන්නාන්සේගේ ගාස්තුද, ඉඩම්වල තක්සේරු ගාස්තුද, ඇප ඔප්පු රිජිස්තර් කිරීමේ ගාස්තුද වෙනුවට මුදල කච්චේරියේ බදු ගැනුම් කාරයා විසින් තැන්පත්කරන්ට ඕනෑය.

5. ඇප බදින්ට යෙදෙන සියලුම ඔප්පුවල ඉඩම් ලියාපදිංචිකරන රිජිස්ත්‍රාර් විසින් ඒ ඉඩම් වෙන ණය, ඇප උකස් ආදියකට යටත්නැති බවට සහතිකපත්‍රයක් තිබෙන්ට ඕනෑය. මේ සහතිකපත්‍රය ඔප්පු බාරදෙන අයගේ වියදමින් ලබාගන්ට ඕනෑය.

6. තවත් වැඩිදුර කාරණ කොළඹ කච්චේරියෙන් ඉල්ලුම් කළවිට ලබාගත හැකිවේ.

7. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙපකිරීමේ බලය ඒජන්ත උන්නාන්සෙ වෙත තබාගන්නා ඇත.

ආර්. ඇන්. තෝන්,
ඒජන්ත උන්නාන්සෙ.

වර්ෂ 1930ක්වූ නොවැම්බර් මස 29වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

කුරුඳුවත්තෙ බදු සිතියමේ සඳහන්ව තිබෙන
කිම්කට්ටි 26 සහ 28.

| නො. | පිහිටීම. | අන්දම. | මහත, අ. රූ. ප. |
| --- | --- | --- | --- |
| 28 | කුරුඳුවත්ත .. | රටකණ .. | 0 3 24·34 |

---

මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුවේ ඉඩම වර්ෂ 1931ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් එක් අවුරුද්දකට බදුදීමට ඉල්ළුම්පත්‍ර බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සෙ විසින් භාරගන්නා බව මෙසින් දැනුම්දෙනු ලැබේ.

2. මෙම මුද්‍රකරණලද ඉල්ලුම්පත්‍ර වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 19වෙනි දිනවූ සිකුරාදා දවල් 1 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩා බලනවා ඇත. ඉල්ලුම් පත්‍ර සැබෑ බව ඔප්පුවීමට ඉල්ලුම්කරන්නාවූ සියලුදෙනාම ඒජන්ත උන්නාන්සෙ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙනීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. බදුගත් මුදලෙන් හතරෙන් කොටසක් ඇපයක් වශයෙන් වෙන්දේසි දිනෙහිදීම බදින්ට ඕනෑවා සහ එක එක මාසයකට වැටෙන මුදල මාසය ඉකුත්වෙන්ට මත්තෙන් බදුකාරයා විසින් ගෙවන්ට ඕනෑය.

2. බදුකාරයාට අයිතිව තිබෙන්නෙ ගස්වල ප්‍රයෝජනය පමණක්ය.

3. බදුකාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට ඉඩමේ තිබෙන ගහක් කපන්ටවත් දැනට පවතින මායිමක් හෝ වැටක් වෙනස්කරන්ටවත් අවසර නැත.

4. බදුකාරයා විසින් බදුගත් ඉඩමේ වැට බදින්ට ඕනෑය කියා ඒජන්ත උන්නාන්සෙ විසින් අණකරන්ට යෙදුනොත් එසේ වැටවල් බදින්ට බදුකාරයා බැඳෙනවා ඇත.

5. කිරිඑලදෙනුන්ට හෝ මීදෙනුන්ට තණකෑමට අවකාශ දියයුතු නොවේ. එසේ තණකෑමට ඉඩහරිනු ලැබූ සතුන් ඇල්ලීමට බදුදීමනාකාරයාට හෝ එතුමාගෙන් කිසි බලය ලත් අයෙකුට අවසර තිබේ.

6. බදුකාරයා ඉඩම සුද්දෙන් සහ හොඳකාර තබාගන්ටත් නාගරිකසභාවේ ආඥාපණත්වල හැටියට පිළිපදින්ට සහ එහි නියමවල හැටියට බදුගෙවන්ටත් ඕනෑය.

7. බදුකාරයාට මාසයකට ප්‍රථම දැනුම්දී ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සෙ හෝ උන්නාන්සෙගේ බලය යටතේ ක්‍රියාකරණ කොයිම කෙනෙකුට නුමුත් ඉඩමේ භුක්තිය නැවත භාරගැනීමට කොයියම්විටකදී නුමුත් අයිතිවාසිකම තබාගත්තා ඇත.

8. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් ගන්නාලද අවසරයක් නැතුව ඉඩමේ බද්ද කිසි කෙනෙකුට පවරන්ටවත්, නැවත බදුදෙන්ටවත් බදුකාරයාට බලය නැත.

9 මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑ කළොත් මාසයක් කල්දැන්වීව ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම් කොටසට ගෙවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගෙවෙන්ට තිබෙන කාලයට බදු මුදලින් ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

10. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා බදුකාරයා සහ ඔහුගේ වැඩකරුවන්වත් ඉඩමෙන් අහක්කර ඉඩමේ භුක්තිය ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සෙට නැවත ගැනීමට බලය තිබේ.

11. යම් කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙපකිරීමේ බලය ඒජන්ත උන්නාන්සෙ වෙත තබාගන්නා ඇත.

(අත්සන්කළේ), ආර්. ඇන්. තෝන්,
බස්නාහිර දිසාවේ ඒජන්තතැන වර්ගය.

වර්ෂ 1930ක්වූ නොවැම්බර් මස 29වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

මේ සඳහන් ඉඩම.

මුල් සිතියමේ නො. 18,728, සැක්ෂන් 1.

| බිම් කට්ටිය. | පිහිටීම. | අන්දම. | බිම්තරම අ. රූ. ප. |
| --- | --- | --- | --- |
| 4 | (කොටසක්) කොටහේන (උතුරු පැත්තේ ගංවතුර බැස්සවීමේ උපක්‍රමයේ උමගට වැටෙන්නාවූ ප්‍රධාන අගලට යාව) | තණකොළ වත්ත | 0 3 32 |

පසුගිය නොවැම්බර් මස 21වෙනි දින නොම්මර 7,815 දරණ ගැසට් එකේ සඳහන්කර තිබුන ඒකල පාරවල්වලට අත්හැර තිබුන බිම්කොටස්වල බද්ද විකිණීම වර්ෂ 1931ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට අවුරුද්දකට පමනක් බව මෙයින් දන්වමි.

ආර්. ඇන්. තේන්,
බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

මෙහි පහත සඳහන්කරන පාරට අත්හැර තිබෙන බිම් තීරුවල තිබෙන ගස්කොලන්වලින් ලැබෙන ප්‍රයෝජනයේ බද්ද වර්ෂ 1931ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුද්දකකට මෙහි පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව බදු ගැනීමට වැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර (එක බිම්තීරුවට එක ගණනේ වෙන්වශයෙන්) බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දැනුම්දෙමි.

2. මෙම වැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 8වෙනි දින පස්වරු 1 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩාබලනවා ඇත. ඉල්ලුම්පත්‍ර හැබෑබව ඔප්පුවීමට ඉල්ලුම්කරන්නාවූ සියලුදෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙණීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1 බදුමිල සම්පූර්ණයෙන්ම වෙන්දේසි දවසේදීම ගෙවිය යුතුයි.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගහක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ටවත් අවසර නැත.

3. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලක් සිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ට වත් නැවත බදුදෙන්ටවත් ගැනුම්කාරයාට අවසර නැත.

4. බදුකාරයා විසින් සියලුම වරිපනම් කාසි ගෙවන්ට ඕනෑය.

5. බදුකාරයා මාසයකට කලින් දැනුම්දී නැවත ඉඩම භාරගන්ට ඒජන්ත උන්නාන්සේට හෝ ඔහුගේ බලයපිට ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.

6. මිලේටගත් අය විසින් ඉඩම පිරිසිදුව හොඳකාර තිබෙන්ට ඕනෑවා සහ ගම්සභාවේ අණපණත්වලට යටත්ව ක්‍රියාකල යුතුයි.

7. කැපීමට ඕනෑකරණ ගස් සියල්ලක්ම ඒජන්ත උන්නාන්සේට කැප්පවීමට බලය තිබේ. ඊට වැටෙහෙන මුදල බදුකාරයාට ආපසු දෙනුලැබේ.

8. ඉහත සඳහන්කරන්ට යෙදුන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා ගැනුම්කාරයා ඉඩමෙන් අහක්කර නැවත අයිතිවාසිකම් භාරගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

9. බදුගැනුම්කාරයා විසින් ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් බලය නොමැතිව කිසියම් අන්දමක ගොඩ නැගිල්ලක් මෙම ඉඩමේ නොකැනිය යුතුයි.

10. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ඉහත සඳහන්කරණලද බිම්කොටස් :—

(1) ඒකල කුරුදුවත්තේ සිට රද්දොළුවට යන පාරට අත්හැර තිබෙන අඩි 66ක් පලල බිම්තීරුවට මායිම්—උතුරට රද්දොළුව යන ගමේ මායිම; නැගෙනහිරට වැන්ලැන්ගැන්බර්ග් නෝනාටද, විජේවර්ධන මහතාට සහ තවත් අයට අයිති ඉඩම්; දකුණට ජාඇළ සහ බස්නාහිරට නැසීගිය අම්බ්‍රෝස් මහතාගේ බූදලේට අයිති ඉඩම සහ ඒ. ඒ. රාජපක්ෂ මුදලිතැනටද, සී. ඇස්. ද මැල් මහතාට සහ තවත් අයට අයිති ඉඩම්ද.

(2) ඒකල කුරුදුවත්තේ සිට රද්දොළුවට යන පාරට අත් හැර තිබෙන අඩි 22ක් පලල බිම්තීරුවේ අයිතිකම් නොකියන කොටසට මායිම්—උතුරට රද්දොළුව යන ගමේ මායිම; නැගෙනහිරට විල්බර් රාජපක්ෂ මහතාවද, දබරේරා අද්වකාත්තැනට සහ තවත් අයට අයිති ඉඩම්ද; දකුණට ඒකල සිට උඩම්මිටට යන පාර සහ බස්නාහිරට දබරේරා අද්වකාත්තැනට සහ තවත් අයට අයිති ඉඩම්ද.

(3) ඒකල කුරුදුවත්තේ සිට උඩම්මිටට යන පාරට අත් හැර තිබෙන අඩි 22ක් පලල බිම්තීරුවට මායිම්—උතුරට ලීනෙයාර් කාස් මහතාගේ බූදලේට අයිති ඉඩම; නැගෙනහිරට ජාඇල සිට මිනුවන්ගොඩට යන පාර; දකුණට නැසීගිය බස්තියන් පීරිස් මහතාගේ බූදලේට අයිති ඉඩම සහ ඒ. ඒ. රාජපක්ෂ මහතාට සහ තවත් අයට අයිති ඉඩම්ද; බස්නාහිරට උඩම්මිට යන ගමේ මායිමද.

(4) ඒකල සිට උඩම්මිටට යන පාරට අත්හැර තිබෙන අඩි 22ක් පලල බිම්තීරුවට මායිම්—උතුරට මාර්කස් ප්‍රනාන්දු දෙස්කර මහතාට සහ තවත් අයට අයිති ඉඩම්; නැගෙනහිරට ජාඇල සිට මිනුවන්ගොඩට යන පාර; දකුණට දබරේරා අද්වකාත්තැනට අයිති ඉඩම් සහ බස්නාහිරට උඩම්මිට යන ගමේ මායිමද.

---

රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධව වර්ෂ 1912යේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

වර්ෂ 1931–32 දරණ වර්ෂය තුල ඌව දිසාවේ පිහිටි බල්ලා කොටුවේ අරක්කු තැබෑරුම සම්බන්ධ ඡන්දය පිළිබඳ දැන්වීමයි.

වර්ෂ 1928ක්වූ අගෝස්තු මස 31වෙනි දිනද, වර්ෂ 1930ක්වූ පෙබරවාරි මස 28වෙනි දිනද, වර්ෂ 1930ක්වූ සැප්තැම්බර් මස 19වෙනි දිනද නිකුත්කළ නොම්මර 7,661, 7,764 සහ 7,806 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රවල පිළිවෙළින් පලකරන ලද නොම්මර 180, 194 සහ 202යේ ඇක්සයිස් දැන්වීම් පත්‍රවලින් ප්‍රතිසංස්කරන කරන්ට යෙදුන වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 14 දින නිකුත්කළ නො. 7,478 දරණ ගැසට් පත්‍රයේ පලකරනලද අංක 6 දරන නියෝගයෙන් ලැබී තිබෙන බලයේ ප්‍රකාර ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් යට දක්වන තැබෑරුමේ සීමාවතුල පදිංචි ඡන්දදායකයින්ගෙන් සීයට 60 දෙනෙක් ඒ සීමාවතුළ එවැනි තැබෑරුමක් විවෘතකිරීමට බලයක් නැවත දීමට සතුටුද යන්න සොයා ගැනීම පිණිස ඡන්ද විමසීමට මෙහි පහත දක්වන දිනය සහ ස්ථානය නියමකර තිබෙන බව මෙයින් දන්වනු ලැබේ. ඡන්ද උදේ 8සිට දවල් 12 දක්වා සහ සවස 1සිට 6 දක්වාද ගනු ලැබේ.

ඡන්දගැනීමේ ස්ථානය—බල්ලාකොටුවේ ඉපීද සාඛපොල.

| තැබෑරුම. | ඡන්ද ගැනීමේ දිනය. | කොට්ඨාසය. |
|---|---|---|
| බල්ලාකොටුවේ අරක්කු තැබෑරුම | වර්ෂ 1931ක්වූ ජනවාරි මස 17වෙනි සෙනසුරාද | නාවෙලගම, ගෝට්ටස්ස සහ ඉහත සඳහන් ගම්වලට අයිති මතු සඳහන් වතුවල කොටසුත්ය. ගලපිටකන්ද, තනමිල, හිඳගල, ඇල්ල වත්ත, රේවන්ස්වුඩ්, කින්ග් ස්ලන්ඩ් සහ පිත්අරාව |

ඒ. ඊ. මිල්ටන්,
ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙනුව.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 1වෙනි
දින බදුල්ල කච්චේරියේදීය.

---

අන්‍ය දැන්වීමයි.

මෙහි පහත අත්සන්කරණ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටිකෝරළේ කොස්ගොඩ පදිංචි අගම්පොඩි ඇලබින් ද සොයිසා වන මම අනුරාධපුර දිස්ත්‍රික්කුවතුල සිංහල භාෂාවෙන් ඔප්පු තිරප්පු ආදියේ කටයුතුකරණ ප්‍රසිඩ නොතාරිස් කෙනෙකු හැටියට පත්කරණු ලැබීම පිණිස මෙතැන් සිට මාස 3ක් ගතවූ පසු රීජිස්ට්‍රාර් ජනරල් උන්නාන්සේගෙන් ඉල්ලුම්කරණ බව වර්ෂ 1907යේ අංක 1 දරණ ආඥාපනතේ 1වෙනි B ෂැඩ්යුල් පත්‍රයේ 2වෙනි පනතෙන් නියමකර තිබෙන ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

(අත්සන) ඒ. ඒ. ද සොයිසා.

27 නොවැම්බර් 1930.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.